ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:28/482
දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධර්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

බෞද්ධෝදය

78 වර්ෂය - ශ්‍රී බු: ව 2566 2023 මාර්තු 06 මැදින් කලාපය

**දෙහිවල ශ්‍රී සුදර්ශන ධර්ම නිකේතනාධිපති
කොළඹ මහානාම විද්‍යාලයේ හිටපු ධර්මාචාර්ය ශාස්ත්‍රපති
පූජ්‍ය ලේල්වල සමිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ.**

`නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

හඳුනාගත යුතු පුද්ගල නානාත්වය

චත්තාරිමානි භික්ඛවේ අම්බානි කතමානි චත්තාරි? ආමං පක්කවණ්ණි පක්කං ආමවණ්ණි ආමං ආමවණ්ණි පක්කං පක්කවණ්ණි ඉමානි , ඛෝ භික්ඛවේ චත්තාරි අම්බානීති.

(අං:නි: චතුක්ක නිපාතය වළාහක වර්ගය අම්බ සූත්‍රය)

පින්වත්නි,

මහණෙනි, අඹගෙඩි හතර වර්ගයක් තියෙනවා
1 ඇතුළතින් අමු පිටතින් ඉදුණුසේ පෙනෙන අඹගෙඩි,
2 ඇතුළතින් ඉදි ඇති නමුත් පිටතින් අමුසේ පෙනෙන අඹගෙඩි,
3 ඇතුළතින් හා පිටතින් දෙකින්ම අමු අඹගෙඩිය,
4 ඇතුළතින් හා පිටතින් යන දෙපසින් ම ඉදුණු අඹගෙඩි,

මහණෙනි, මේ අඹගෙඩි හතර වගේ පුද්ගලයෝ හතර දෙනෙකුත් ඉන්නවා

1. ඇතුළතින් අමු පිටතින් ඉදුනුසේ පෙනෙන අඹ ගෙඩිය බඳු පුද්ගලයා

මේ පුද්ගලයා පිටතින් බලන කෙනෙකුට පෙනෙන්නේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත හික්මුණු සාන්ත දාන්ත කෙනෙකු වගෙයි ඒ වුණාට ඒ පුද්ගලයා බාහිර සමාජයට පෙන්නගෙන ඉන්න ඒ ශාන්ත ස්වරූපය ඔහු තුළ නැහැ, කුණු වෙච්ච වට්ටක්කා ගෙඩිය වගෙයි පිටත් හොඳ වගේ පේනවා නමුත්, ඇතුළතින් කුණු වෙලා

එක් දවසක් කොසොල් මහ රජතුමා හමුවෙන්න ඇවිත් හිටියා මේ වෙලාවේ ජේතවනාරාමය අසල පාරේ අන්‍ය ආගමිකයන් කණ්ඩායමක්, ගියා එතැන ජටිලයෝ හත් දෙනයි අචේලකයෝ හත් දෙනයි, නිගණ්ඨයෝ හත්දෙනයි, ඒක සාටක හත් දෙනයි, වශයෙන් කණ්ඩායම් කිහිපයක් හිටියා රජතුමා අසුනින් නැගිටලා ඔවුන්ට ගරු බුහුමන් දක්වලා බුදුහාමුදුරුවන්ට මෙහෙම කිව්වා 'ස්වාමීනි මේ ලෝකේ රහත් වූ අය ඉන්නවා නම් ඔය දැන් ගිය, පිරිස ඒ රහතුන්ගෙන් එක්තරා කොටසක් එවිට බුදුහාමුදුරුවෝ වදාරනවා" ගිහියෙකු වූ කාම සම්පත් පිළිගන්නාවූ ඔබට ඔවුන් රහත් ද නොරහත් ද? කියල දැන ගන්න අමාරුයි ඊළඟට බුදුහාමුදුරුවෝ පුද්ගලයකුගේ සිල්වත්කම සුවච කීකරුකම උත්සාහවන්ත කම ඤාණවන්තකම දැන ගත හැකි ක්‍රමය දේශනා කළා මේ දේශනාව ඇසූ රජතුමා කියනවා "ස්වාමීනි හරිම පුදුමයි, ඔබ වහන්සේ කී කරුණු සම්පූර්ණ ඇත්ත, දැක්ක ගමන් කෙනෙකු ගැන පැහැදෙන එක වැරදි තමයි ස්වාමිනි, ඒ පාරේ ගියෙ ඒ ඒ , ආගම්වලට අයත්, පැවිද්දො නෙවෙයි ඔවුන් මගේ චර පුරුෂයන්, ඔය පිරිස ඔය විදියට වෙස් වලා ගෙන ගම් දනව්වල ඇවිදල රහස් තොරතුරු සොයනවා පිටතින් පෙනෙන විදියට පුද්ගලයකු මනින්න බැරි බවට ඔබ වහන්සේ, වදාළ කරුණ සත්‍යයක්" කියලා රජතුමා ප්‍රකාශ කළා.

මේ වගේ සමහර පුද්ගලයන් ඉන්නවා ඔවුන්ට චතුරාර්ය සත්‍ය ධර්මය ගැන වැටහීමක් නැහැ. එහෙත් ඒ අය පෙන්වන්නේ තමන් චතුරාර්ය සත්‍ය අවබෝධ කරගත් රහතන් වහන්සේලා විදියටයි. මේ ඇතුළතින් අමු පිටතින් ඉදුණු වගේ පේන අඹ ගෙඩි වගෙයි.

2. සමහර පුද්ගලයන් යන එන හැටි කථා බහ කරන හැටි අනෙක් ඉරියව් පවත්වන හැටි දකින අයට පැහැදීමක් ඇති කරන්නේ නැත. ඒ වුනාට ඒ අය

මේ දුකයි, කියා දන්නවා මේ දුකට හේතුවයි, කියා දන්නවා මේ දුකින්, මිදීමයි, කියා දන්නවා බලන් කෙනෙකුට මේ තැනැත්තා ආර්ය ධර්මය දන්නා කෙනෙකු බව පෙන්නේ නැත. දායකයාගේ ගෙදර දානෙට වඩිද්දී පළමු වැනි වක්කඩෙන් පැන ගියා දෙවෙනි වක්කඩෙ බැස ගිය හාමුදුරුවන්ගේ කථාවක් අනෙක් අයට වසලයා යන නමින් ආමන්ත්‍රණය කළ පිළින්දිවච්ඡ රහතන් වහන්සේගේ කථාවක් මෙහිදී සිහිපත් කර ගන්න, පිටතින් රළු වගේ පෙනුනට ඇතුළතින් පිරිසිදු වූ චතුරාර්ය සත්‍යය අවබෝධ කරගත් උතුම් පුද්ගලයනුත් සිටිනවා.

3. ඇතුළතින් හා පිටතින් යන දෙපසින් ම අමු අඹ ගෙඩියට සමාන පුද්ගලයන් මේ සමාජය තුළ සිටිනවා දේවදත්ත කෝකාලික වැනි එබඳු භික්ෂූන් බුද්ධ කාලයෙත් සිටියා මේ තුන්වැනි කොටසට අයත් වන පුද්ගලයන්ගේ හොඳ වශයෙන් ගත හැකි කිසිවක් නැත, කියල කෙනෙකුට හිතෙන්න පුළුවන් ඒ අය තමන්ගේ සැබෑ මුහුණුවර හංගන්නේ නැතිව සිටීමත් එක්තරා විදියකින් හොඳ ගතියක් කියල පෙනෙනවා එවිට බුද්ධිමත් අයට ඒ පුද්ගලයා හඳුනාගෙන ඇසුරට නොගෙන ඉන්න පුළුවන් වෙනවා.

4. ඇතුළතින් වගේම පිටතිනුත් ඉදුණු අඹ ගෙඩිය බඳු පුද්ගලයා උතුම් කෙනෙක් ඔහු චතුරාර්ය සත්‍ය ධර්මය දන්නවා විතරක් නෙවෙයි. ඒ ධර්මය අනුව තමන්ගේ ජීවිතය නොපැහැදුනුවුන් ගේ පැහැදීම පිණිසත් පැහැදුනුවුන් ගේ පැහැදීම වැඩි දියුණු වීම පිණිසත් හේතු වන පරිදි පවත්වා ගන්නවා බ්‍රහ්මායු බමුණාගේ ශිෂ්‍යයා වූ උත්තර මානවකයා බුදුහාමුදුරුවන් වරදක් සොයන්න මාස හතක්, පසු පසින් ගියත් ගුණ මිස අගුණයක් නොදුටු බව මජ්ඣිම නිකායේ බ්‍රහ්මායු සූත්‍රයේ සඳහන් වෙනවා.

අද සමාජයේ වැඩියෙන් ඉන්නේ ඇතුළතින් අමු පිටතින් ඉදුණු වගේ පේන අඹ ගෙඩි බඳු අය සහ ඇතුළ පිට දෙකෙන්ම අමු වූ අඹ ගෙඩි බඳු අය බව පැහැදිලිව පෙනෙනවා මාරයා සතුටු වෙන්නෙත්, එබඳු අය වැඩි වුණාමයි. පුද්ගලයන් හඳුනාගන්න බැරි විදියට මාරයා තමන්ගේ දැළ එලා තිබෙනවා මුළු මහත් සමාජයම අවුලට පත් වී ඇත්තේ පුද්ගලයා, හරි හැටි හඳුනා ගත නොහැකි, වීම නිසයි. සමාජය රවටන්න හදන අය දැනගත යුතුය. අවසානයෙ තමාම රැවටෙන බව ඒ බව ඔවුන්ට අවබෝධ වන විට ජීවිතයේ හොඳම කාලය ගතවී තිබෙන්නත් පුළුවන් ඒ නිසා හැම දෙනාම බුද්ධිමත්ව

ධර්මානුකූලව තමන්ගේ ජීවිතය ගත කිරීමට සිතට ගත යුතුයි.

සත්ත ජටිල සූත්‍ර දේශනාව මගින් ද තමා ජීවත් වන සමාජයේ වෙසෙන අදහස් විවිධ වූ පුද්ගලයන් දෙස තියුණු ඇසකින් බැලීමට පුද්ගලයාට මග පෙන්වනවා සමාජයේ. පුද්ගලයන් අතර බොහෝ ගැටුම් ඇති වන්නේ, මෙම විවිධ වූ පුද්ගල චරිත නිවැරදිව හඳුනා නොගැනීමෙන් අවිශ්වාසය හා සැකය ඉස්මතු වීම නිසාය.

පුද්ගලයකුගේ චරිත ස්වභාවය හඳුනා ගැනීම අපහසු කටයුත්තක් නොවන බව සත්ත ජටිල සූත්‍රයේ දී පෙන්වාදෙන බුදුරජාණන්වහන්සේ, ඒ සඳහා නිරීක්ෂක පුද්ගලයා තුළ තිබිය යුතු සුදුසුකම් කිහිපයක්ද හඳුන්වා දෙති.

අන්‍යයන්ගේ චරිත නානත්වය තේරුම් ගත හැකි, විමසුම් සහගත නුවණක් තිබීම පළමුවැන්නයි, (පඤ්ඤවතා) දෙවෙනි සුදුසුකම වන්නේ දිගු කාලයක්, එම පුද්ගලයා ගැන නිරීක්ෂණය කළ හැකි වීමයි.(දිඝේන අද්ධුනා) එකී පුද්ගලයාගේ අතීත හා වර්තමාන ක්‍රියාකාරකම් සංසන්දනාත්මකව මෙනෙහි කිරීමේ හැකියාව තුන්වන සුදුසුකමයි. (මනසි කරෝතා)

මේ අයුරින් පුද්ගල හඳුනා ගැනීම දුෂ්කර කටයුත්තක් වන්නේ බොහෝ පුද්ගලයන් තමාගේ සැබෑ ස්වරූපය සඟවා මවාගත් ස්වරූපයක් සමාජයට පෙන්වන නිසාය. එබඳු පුද්ගලයන් රන් ආලේපිත ලෝහමය අඩ මස්සක් ලෙස උපමා කර ඇත. පිටතින් තිබුනත් ඇතුළත් ඇත්තේ යකඩය. බුදුරජාණන් වහන්සේ අගය කරන්නේ පුද්ගලයා මවා පෙන්වන බාහිර ආටෝපය නොව අධ්‍යාත්මික වශයෙන් ඇති කරගත යුතු සංවරයයි. එබඳු අභ්‍යන්තර සංවරයක් නැති තැනැත්තා පැසුණු සේ, පෙනෙන එහෙත් ඇත්තටම නොපැසුණු අඹ ගෙඩියක් වැනිය.

ඔබ සැමට තෙරුවන් සරණයි !